## (09) දකුණු පළාතේ 1990 අංක 06 දරන පළාත් පාලන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයින් පළාත් පාලන ආයතනවලට ලබා දීමට හැකියාව සඳහාත්, ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහාත් විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මේ ප්‍රඥප්තිය 1980 අංක 36, 1985 අංක 10 සහ 1987 අංක 16 දරන පනත් වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන පනතට අනුකූල වේ.

ලුහුඬු නාමය

**01.** මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1990 අංක 06 දරන පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය.

පළාත් පාලන සේවයේ සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීම

**02**. 1. (අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු ඔහුගේ කැමැත්ත ඇතිව සහ පළාත් පාලන කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයක පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව හෝ එවැනිම කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකිය.

(ආ) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව පත් කරනු ලැබූ විට කලින් කල සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ (20) (අ) වන වගන්තියේ (2) සහ (3) වන උප වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එකී සාමාජිකයන්ට අදාළ විය යුතුය.

2. (අ) පළාත් පාලන සේවයේ සාමාජිකයෙකු පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවකදී කලින් කල සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ (20) (අ) වන වගන්තියේ (4) උප වගන්තියේ විධිවිධාන අදාළ වෙනස් කිරීම් සහිතව ඒ සාමාජිකයාට අදාළ විය යුතුය.

(ආ) එවැනි සාමාජිකයෙකු පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ දින සිට පළාත් පාලන සේවය අතහැර ගිය තැනැත්තෙකු ලෙස සලකනු ලැබිය යුතු



අතර, ඒ අනුව ඔහු එසේ පත් කරන ලද අවස්ථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නෙකු වූයේ නම් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල නියමයන් ප්‍රකාර ප්‍රදානයන් ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේය.

එසේ වුවද, එකී ප්‍රදානය ඔහුට ගෙවනු ලැබිය යුත්තේ පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවා නියුක්තිය අවසන් වීමෙන් පසුව පමණකි.

(ඇ) ඉහත (2) 1 (අ) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු එසේ පත් කරන ලද අවසථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නෙකුව සිටියේ නම්, පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවය, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා විශ්‍රාම වැටුප් හිමි සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ සාමාජිකයෙකු පිළිබඳ විනය පාලනය සහ පත් කිරීම, ඔහුගේ ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම ආදිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**03.** පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් මුදා හැරීම, විශ්‍රාම ගැන්වීම, ඔහුගේ තනතුර අහෝසි කිරීම, ඔහු ධූරයෙන් අස් කිරීම සහ ඔහු පිළිබඳ විනය පාලනය ඒ සාමාජිකයා පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තියෙහි යෙදී සිටින තාක් කල් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

එසේ වුවද, එවැන්නෙකු පිළිබඳ විනය පාලන කටයුතු ඉහත සඳහන් පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුකූල විය යුතුය.

**04.** (1). පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ නිලධරයෙකුගේ සේවය පළාත තුළ පිහිටි යම් පළාත් පාලන ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන කාලපරිච්ඡේදයකට එවැනි පළාත් පාලන ආයතනයකට ලබා දිය හැකිය යන්න එසේ පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලබන සෑම නිලධරයෙකු සම්බන්ධයෙන්ම නියමයන් සහ කොන්දේසියක් වන්නේය.

(2). ඉහත 1 වන උප වගන්තිය යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකුගේ සේවය පළාත් පාලන ආයතනයට ලබා දුන් අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයේ වෙනත් යම් නිලධරයෙකුට අදාළ වන විනය පාලනයටම ඔහු යටත් වන්නේය.